මගේ අංකය : සී.ප්‍රා.ස /1/5/2018,

සීතාවක ප්‍රාදේශීය සභාව,

හංවැල්ල.

2018.04.09.

සීතාවක ප්‍රාදේශීය සභාවේ,

ගරු සභාපති/උප සභාපති/ මන්ත්‍රී,

..........................................................................................

මැතිතුමනි / මැතිතුමියනි,

**2018 අප්‍රේල් මස මහා සභා රැස්වීම – 01 වන මහා සභාව.**

සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 අප්‍රේල් මාසයට නියමිත 01 වන මහා සභා රැස්වීම 2018.04.17 වන අඟහරුවාදා දින, පෙ.ව. 10.00 ට සීතාවක ප්‍රාදේශීය සභාවේ සභා ශාලාවේ දී පැවැත්වේ.

එදිනට ඔබතුමාගේ පැමිණීම ගෞරවයෙන් බලාපොරොත්තු වෙමි.

මෙයට,
ගරු සභාපතිතුමාගේ නියමය පරිදි,

කේ.ඒ. චන්දන පද්මසිරි,
ලේකම්,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

**න්‍යාය පත්‍රය.**

1. පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කර ගැනීම.

2. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරිම.

4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.

5. යථා පරිදි කල් දී ඇති යෝජනා.

**<u>05 - (01) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

2011.04.25 වන දින පැවති මහා සභාවේ 04 - (01) සභා සම්මුතිය පරිදි සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කරන ලද කේ.ජ්. චන්දන පද්මසිරි මහතා 2018.03.29 වන දින සිට නැවතත් සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 – (02) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

පාදුක්ක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සේවය කරනු ලබන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය හා හංවැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සේවය කරනු ලබන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය සීතාවක ප්‍රාදේශිය සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේම කොටසක් වශයෙන් පිළිගත යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 - (03) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන විශේෂ විධිවිධාන පනතේ 16 වන වගන්තිය ප්‍රකාර සීතාවක ප්‍රාදේශීය සභා අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වු චෙක්පත් හෝ අණකර අත්සන් කිරිම සඳහා පළමු අත්සන්කරු ලෙස සීතාවක ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමනාකරණ සහකාර කේ.ඩී. සන්ධ්‍යා මාලනී මිය / ගිණුම් කළමනාකරණ සහකාර එස්.ඩී සිරෝෂිණී මිය හා දෙවන අත්සන්කරු ලෙස සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ.ජ් චන්දන පද්මසිරි මහතා වෙත බලය පැවරිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 - (04) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්තිය හා 1989 අප්‍රේල් 17 අංක 554/5 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් 1988 ප්‍රාදේශීය සභා රීති (මුල්‍ය හා පරිපාලන) වලට අනුකූලව සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයට අදාලව පහත සඳහන් කාරක සභා පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව
02.නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව
03.කාර්මික සේවා කාරක සභාව
04.පරිසර හා පහසුකම් කාරක සභාව
05. ටෙන්ඩර් මණ්ඩලය

**<u>05 – (05) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

එක් වරකට රුපියල් ලක්ෂ පහක උපරිමයක් දක්වා මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සීතාවක ප්‍රාදේශීය සභා අරමුදලින් මුදල් වියදම් කිරිමට සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මහතාට බලය පැවරිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 – (06) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

සීතාවක ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීම් කිරීමේදී රුපියල් ලක්ෂ පහළොවක සීමාව තුල සියළු ගෙවීම් අනුමත කිරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව වෙත පවරා දිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**06.** කාරක සභා වාර්තා.

**07.** ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.

**08.** වෙනත් කරුණු.